සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

**7 ශ්‍රේණිය** **පළමු වාර පරීක්ෂණය - 2019**

නම ...............................................

**භූගෝල විද්‍යාව** **කාලය පැය දෙකයි**

**උපදෙස් :**
**I කොටසෙහි ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**
**II කොටසේ පළමු ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න 04කට පිළිතුරු සපයන්න.**

## I කොටස

- **අංක 01 සිට 05 දක්වා ප්‍රශ්න වල හිස්තැනට සුදුසු වචනය වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.**

01. පෘථිවි ගෝලයේ මතුපිට වර්ග ප්‍රමාණය වර්ග කිලෝමීටර් මිලියන ................................................ ක් පමණ වේ.
(510/ 610/ 560)

02. දේශාංශ $180^0$ රේඛාව පදනම් කරගෙන ................................................ නිර්මාණය කර ඇත.
(ග්‍රිනිච් රේඛාව/ සම්මත දින රේඛාව/ සමකය)

03. පෘථිවි පෘෂ්ඨයේ 71% ක් ................................................ වැසී ඇත.
(ජලයෙන්/ ගොඩබිමෙන්/ සාගරවලින්)

04. මහද්වීප අතර විශාලත්වයෙන් දෙවන ස්ථානය හිමි වන්නේ ................................................ මහද්වීපයටයි.
(අප්‍රිකා/ උතුරු ඇමරිකා/ දකුණු ඇමරිකා)

05. වෙරළ මායිමේ සිට නාවික සැතපුම් 12 ක සීමාව .............................................ලෙස හඳුන්වයි.
(පරම ආර්ථික කලාපය/ රාෂ්ට්‍රීය මුහුදු සීමාව/ යාබද මුහුදු)

- **අංක 06 සිට 10 දක්වා ප්‍රශ්න වල දැක්වෙන ප්‍රකාශ නිවැරදි නම් (✓) ලකුණද, වැරදි නම් (x) ලකුණද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.**

06. සමකයට සමාන්තරව නැගෙනහිර - බටහිර දිශානුගතව විහිදෙන රේඛා අක්ෂාංශ වේ. (........)

07. පෘථිවිය ගෝලාකාර වස්තුවක් වන අතර එය පූර්ණ ගෝලයකි. (........)

08. ජාත්‍යන්තර දින රේඛාව සෘජු රේඛාවක් ලෙස පිහිටා ඇතැයි සැලකේ. (........)

09. අක්ෂාංශ හා දේශාංශ අනුව රටක පිහිටීම දැක්වීම නිරපේක්ෂ පිහිටීමයි . (........)

10. දූපතක් වූ ශ්‍රී ලංකාවට වර්ෂය මුළුල්ලේම පැතිරුණු වර්ෂාපතනයන් ලැබේ. (........)

- **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්න වලට දී ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

11. උතුරු අක්ෂාංශ 66 $1/2^0$ කල්පිත රේඛාව හඳුන්වන නම කුමක්ද?
    01. කර්කටක නිවර්තනය
    02. මකර නිවර්තනය
    03. ආර්ටික් වෘත්තය
    04. ඇන්ටාක්ටික් වෘත්තය

12. ජපන් දූපත් අයත් වන මහාද්වීපය කුමක්ද?
    01. යුරෝපා මහාද්වීපය
    02. ආසියා මහාද්වීපය
    03. ඕස්ට්‍රේලියා මහාද්වීපය
    04. උතුරු ඇමරිකා මහාද්වීපය

13. බෙංගාල බොක්ක ප්‍රදේශයේ හටගන්නා වායු කැළඹීම් හේතුවෙන් ශ්‍රී ලංකාවට වැසි ඇතිවන ක්‍රමය කුමක්ද?

01. සංවහන
02. වාසුළි
03. නිරිත දිග මෝසම්
04. ඊසාන දිග මෝසම්

14. අභ්‍යන්තර තැනිතලාවේ දක්නට ලැබෙන භූ ලක්ෂණයකි.

01. කපොල්ල
02. හෙල්වැටි
03. නිම්නය
04. කලපුව

15. යුරෝපා මහද්වීපයට අයත් රටක් වන්නේ පහත ඒවායින් කුමක් ද?

01. චීනය
02. ලිබියාව
03. ප්‍රංශය
04. බ්‍රසීලය

- **අංක 16 සිට 20 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර හිස්තැන මත ලියන්න.**

16. පෘථිවිය තම අක්ෂය වටා එක් වරක් භ්‍රමණය වීමට ගතවන පැය 24ක කාලය ............................................ ලෙස හඳුන්වයි.

17. පෘථිවි ගෝලයේ සමක පරිධිය ධ්‍රැවක පරිධියට වඩා ............................................ වේ.


18. පෙබරවාරි සහ අගෝස්තු මාස වලදී ශ්‍රී ලංකාවට සාමාන්‍යයෙන් ............................................ කාලගුණයක් පවතී.

19. සාගර ජලයෙන් වට වූ විශාල ගොඩබිම් ප්‍රදේශ ............................................ ලෙස හැඳින්වේ.

20. ශ්‍රී ලංකාව කර්කටක නිවර්තනයත් මකර නිවර්තනයත් අතර ............................................ කලාපයේ සමකයට ආසන්නව පිහිටා ඇත.

## II කොටස

01. පහත දැක්වෙන ලෝක සිතියම ඇසුරින් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.




(අ)

(i) A අක්ෂරයෙන් දැක්වෙන ලොව විශාලතම දූපත නම් කරන්න. (ල. 02)

(ii) තනි රටක් ලෙස පවතින මහද්වීපය දැක්වෙන්නේ කිනම් අක්ෂරයෙන්ද? (ල. 02)

(iii) සිතියමේ අංක 1, 2 හා 3 ක් දක්වා ඇති රටවල් තුන නම් කරන්න. (ල. 03)

(iv) F හා G දේශාංශ රේඛා හඳුන්වන නම් පිළිවෙලින් ලියන්න. (ල. 02)

(v) X, Y, Z අක්ෂරවලින් දැක්වෙන අක්ශාංශ රේඛා නම් කරන්න. (ල. 03)


(ආ) ශ්‍රී ලංකාවේ දිග හා පළල දැක්වෙන පහත සිතියමේ A, B, C හා D වලින් දැක්වෙන ස්ථාන පිළිවෙලින් නම් කරන්න. (ල. 04)

A. ..................................


B. ..................................

C. ..................................

D.....................................



02. ශ්‍රී ලංකාවේ ප්‍රධාන භූ විෂමතා කලාප දැක්වෙන පහත සිතියම ඇසුරින් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.





i. A, B හා C භූ විෂමතා කලාප පළිවෙලින් නම් කරන්න. (ල. 03)

ii. A කලාපයේ දක්නට ලැබෙන භූ විෂමතා ලක්ෂණ 03ක් ලියන්න. (ල. 03)

iii. B හා C කලාප වල දැක්වෙන භූ ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ. ඒවා අයත් වන්නේ ඉහත කුමන භූ විෂමතා කලාපයටදැයි ඉදිරියෙන් ලියන්න.

1. සානු ..............................................................................................
2. ශේෂ කඳු ..............................................................................................
3. දිය ඇල්ල ..............................................................................................
4. කඳු වැටි ..............................................................................................
5. හෙල් වැටි .............................................................................................. (ල. 05)

03. පහත දැක්වෙන ආදර්ශ ලෝක ගෝලය ඇසුරින් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.




i. සමකය දක්වා ඇත්තේ කුමන අක්ෂරයෙන් ද? (ල. 02)


ii. C අක්ෂරයෙන් දැක්වෙන අක්ෂාංශය නම් කර එහි වටිනාකම ලියන්න. (ල. 02)

iii. F අක්ෂරයෙන් දැක්වෙන අක්ෂාංශය නම් කර එහි වටිනාකම ලියන්න. (ල. 02)

iv. ඉහත අක්ෂාංශ රේඛාවල වැදගත්කම් 02 ක් ලියන්න. (ල. 02)

v. ශ්‍රී ලංකාවේ පිහිටීම අක්ෂාංශ හා දේශාංශ අනුව ලියා දක්වන්න. (ල. 03)


04. i. ශ්‍රී ලංකාවට වර්ෂාපතනය ලැබෙන ක්‍රම හා කාල සීමා ඇසුරින් පහත සටහන සම්පූර්ණ කරන්න.




(ල. 09)

ii. සංවහන වර්ෂාව හඳුන්වන වෙනත් නම් 02ක් ලියන්න. (ල. 02)

05. ශ්‍රී ලංකාවේ සාපේක්ෂ පිහිටීමට අදාල පහත දැක්වෙන සිතියම ඇසුරින් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.




i. ශ්‍රී ලංකාවට උතුරින් පිහිටි මහද්වීපය හා දකුණින් පිහිටි සාගරය නම් කරන්න. (ල. 02)


ii. C අක්ෂරයෙන් දැක්වෙන රට නම් කරන්න. (ල. 02)

iii. ශ්‍රී ලංකාව ඉන්දියාවෙන් වෙන්වන මුහුදු තීරය A වලින් දක්වා ඇත. එය නම් කරන්න. (ල. 02)

iv. නිකොබාර්, මාලදිවයින්, අන්දමන් යන දූපත් සිතියමේ x, y, z වලින් දැක්වේ ඒවා නිවැරදිව x, y, z පිළිවෙලින් නම් කරන්න. (ල. 03)

v. ශ්‍රී ලංකාවට බටහිරින් පිහිටි මහද්වීපය B අක්ෂරයෙන් දැක්වේ. එය නම් කරන්න. (ල. 02)

06. ඔබට සපයා ඇති උපකාර පද ඇසුරින් ප්‍රහේලිකාව සම්පූර්ණ කරන්න.




පහළට :- (ල. 11)

01. $0^0$ දේශාංශ රේඛාව වැටී ඇත්තේ මෙම නරගය හරහාය.

03. ආසියා මහාද්වීපය තුළ පිහිටි අභ්‍යන්තර මුහුදකි.

05. ආදර්ශ ලෝක ගෝලයේ තිරස් අතට හරි මැදින් වැටී ඇති අක්ෂාංශ රේඛාව

07. ශ්‍රී ලංකාවේ සානු ප්‍රදේශවල දක්නට ලැබෙන වෘක්ෂලතා වර්ගයකි

හරහට :-

02. මධ්‍යම කඳුකරයේ දක්නට ලැබෙන භූ විෂමතා ලක්ෂණයකි

04. ශ්‍රී ලංකාව පිහිටා ඇත්තේ මෙම දේශගුණ කලාපයේය.

06. පෘථිවිය සූර්යා වටා ගමන් කිරීම මේ නමින් හඳුන්වයි


08. විශාලත්වයෙන් 05 වන ස්ථානය හිමි මහද්වීපයවේ

09. වෙරළ ආශ්‍රිත කලපු හා ගංගා මෝයවල දක්නට ලැබෙන ශාක විශේෂයකි

10. මහද්වීප ආසන්නයේ හා අභ්‍යන්තර ප්‍රදේශවල පිහිටි කරදිය සහිත කුඩා ජලතල මේ නමින් හඳුන්වයි

11. ජලයෙන් වටවූ කුඩා ගොඩබිම් ප්‍රදේශ මේ නමින් හඳුන්වයි.

07. ශ්‍රී ලංකාවේ ජාතික උරුම ඇසුරින් පහත සටහන සම්පූර්ණ කරන්න. (ල. 11)



# පළමු වාර පරීක්ෂණය - 2019
# භූගෝල විද්‍යාව (පිළිතුරු පත්‍රය) 7 ශ්‍රේණිය

## I - කොටස

(i) 1. 510 2. සම්මත දින රේඛාව 3. ජලයෙන් 4. අප්‍රිකා මහාද්වීපය

5. රාෂ්ට්‍රීය මුහුද නිමාව 6. ✓ 7. x 8. x 9. ✓

10. ✓ 11 (iii) 12. (ii) 13. (ii) 14. (ii) 15. (iii)

16. දවසක් 17. විශාල 18. වියළි 19. මහද්වීප 20. නිවර්තන

## II කොටස

01. (I) ග්‍රීන්ලන්තය

(ii) C අක්ෂරය

(iii) 1. අ: එ: ජ 2. ඉන්දියාව 3. ජපානය

(iv) F ග්‍රිනිච් මධ්‍ය දේශාංශය, G ජාත්‍යන්තර දින රේඛාව

(v) X - කර්කටක නිවර්ථනය Y - සමකය Z - මකර නිවර්ථනය

(vi) A - පේදුරු තුඩුව B - දෙවුන්දර තුඩුව C - කොළඹ D - සංගමන් කන්ද තුඩුව

02 (i) A - වෙරළබඩ තැනිතලාව B - අභ්‍යන්තර තැනිතලාව C - මධ්‍යම කඳුකරය

(ii) බොකු, කලපු, තුඩු, ගංමෝය, ඩෙල්ටා

(iii) 1. C මධ්‍යම කඳුකරය 2. B අභ්‍යන්තර තැනිතලාව 3. C මධ්‍යම කඳුකරය

4. C මධ්‍යම කඳුකරය 5. B අභ්‍යන්තර තැනිතලාව

03. (i) D (ii) කර්කටක නිවර්ථනය ($23.5^0$) (iii) ඇන්ටාටික් වෘත්තය ($66.5^0$)

(iv) නිශ්චිතව පිහිටීම දැනගත හැකිවීම, රටවල් සීමාවන් දැක්වීමට ප්‍රදේශ වෙන් කිරීම.

(v) උ. අ. $5^0$ - $10^0$ හා නැ. දේ. $79^0$ - $82^0$

04. (1) 1. ඊසාන දිග මෝසම් වර්ෂාව 2. අප්‍රේල් 3. සැප්තැම්බර්

4. දෙසැම්බර් 5. නිරිතදිග මෝසම 6. ජූනි

7. ජූලි 8. නොවැම්බර් 9. දෙසැම්බර්

2. අසනි වැසි, සවස්කල වැසි

05. (i) ආසියා මහද්වීපය, ඉන්දියන් සාගරය

(ii) ඉන්දියාව

(iii) පෝක් සමුද්‍ර සන්දිය

(iv) X - මාලදිවයින Y - නිකෝබාර් දූපත් Z - අන්දමන් දූපත්

(v) අප්‍රිකා මහද්වීපය

06. පහළට :- 1. ග්‍රිනිච් නගරය 3. කැස්පියන් මුහුද 5. සමකය 7. පතන

හරහට :- 2. නිම්න 4. නිවර්තන 6. පරිභ්‍රමණය 8. ඇන්ටාක්ටික් 9. කඩොලාන 10. මුහුදු 11. දූපත්

07. 1. ස්පෘශ්‍යඋරුම 2. ස්භාවික නිර්මිත 3. ආගන්තුක සත්කාර, වැඩිහිටියන්ට සැලකීම

4. සිරිත් විරිත් 5. ආගමික මධ්‍යස්ථාන 6,7 සිංහරාජ / නාමල් උයන / හික්කඩුව වෙරළ, උණුදියළිං